සී/ස තලාතුඔය මාරස්සන විවිධ සේවා සමුපකාර සමිතිය

සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සී/ස තලාතුඔය මාරස්සන විවිධ සේවා සමුපකාර සමිතියේ පහත සඳහන් තනතුර සදහා සුදුසුකම් ලත් අය බදවා ගැනීම සදහා මහනුවර දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සමිතිය විසින් පිළියෙල කර ඇති අයදුම්පතක් මගින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර සමිතියේ ප්‍රධාන කාර්යාලයෙන් වැඩකරන වේලාවන් තුල රු.300/- ක මුදලක් ගෙවා අයදුම් පත සහ සුදුසුකම් පිළිබද විස්තර ලබා ගත හැකිය. තැපෑලෙන් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සදහා ලිපිනය ලියූ මුද්දර සහිත ලිපි කවරයක් රු.300/- ක් වටිනා මුදල් ඇණවුමක් එවීමෙන් ලබා ගත හැකිය.

අයදුම්පත් සමග සුදුසුකම් සනාත කිරීමට අදාළ සහතික පිටපත් සමගින් 2026.12.16 දිනට පෙර සමිතියේ ගරු සභාපති වෙත පහත සඳහන් ලිපිනයට ලේඛණගත තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතුය. ලිපි කවරයේ වම්පස උඩ කෙලවරේ **"සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අයදුම් පත"** යනුවෙන් සඳහන් කළ යුතුය. දැනට සමුපකාර සමිති වල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මගින් පමණක් අයදුම්පත එවිය යුතුය.

1. තනතුර :- H.L. -01:01 වැටුප් පරිමාණයේ සාමාන්‍යාධිකාරී i ii iii

වයස් සීමාව :- 18 - 50 (මේ වන විටත් සමුපකාර ක්ෂේත්‍රයේ නියුතු ස්ථිර සේවකයින්ට අදාළ නොවේ.)

වැටුප් පරිමාණය :- 46800-755X10-1135 X10-1510 X10 = 80800/-

(මෙයට අමතරව රු.3000.00 දීමනාවක් සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවා නියුක්තයන්ගේ භාරකාර (ETF) අරමුදල, විශ්‍රාම වැටුප් හිමි වන අතර සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත සියලු දීමනා ගෙවනු ලැබේ.)

සුදුසුකම්

(අ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ii ශ්‍රේණියේ වසර 03 ක ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 05 ක ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරක වසර 06 ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පලපුරුද්දක් තිබීම.

හෝ

(ආ) පිළගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමත්වී තිබීම. (රාජ්‍ය පරිපාලනය/ කළමනාකරණය /වාණිජ / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සදහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.) /උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය /ව්‍යාපාර පරිපාලනය/මානව සම්පත් කළමනාකරණය යන ඩිප්ලෝමාවනට අදාලව වසර 2 1/2 ක පාඨමාලාවක් සමත් වී තිබීම

හෝ

(ඇ) සමුපකාර සංවර්ධන ආයතනය/ පිළගත් ආයතනයක සමුපකාර ව්‍යාපාරයට අදාල විෂයන් ඇතුලත් මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම / පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් පවත්වනු ලබන සමුපකාර ව්‍යාපාරයට අදාළ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත්වීම සමග නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ii ශ්‍රේණියේ වසර 02 ක ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරක වසර 03 ක්/ සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පලපුරුද්දක් / සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරක වසර 03 ක් ස්ථිර සේවා පලපුරුද්දක් තිබීම.

මෙයට,
ගරු සභාපති.
සී/ස තලාතුඔය මාරස්සන විවිධ සේවා සමුපකාර සමිතිය,
දුරකථන අංක 0812- 404227
2026.11.06